පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක - 487

ආයතනයේ නම - රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව

පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119(4) යටතේ ගරු අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.

நாடாளுமன்ற வெளியீட்டுத் தொடர் எண் – 487

நிறுவனத்தின் பெயர் - அரசு தொழிற்சாலைகள் துறை

நாடாளுமன்றத்தின் பொதுக் கணக்குகள் குழுவால் தாக்கல் செய்யப்பட்ட அறிக்கைகள் மீது, நிலை ஆணை எண் 119(4)-இன் கீழ் மாண்புமிகு அமைச்சர் அவர்களால் எடுக்கப்பட்ட கருத்துக்களையும் நடவடிக்கைகளையும் நாடாளுமன்றத்திற்குச் சமர்ப்பித்தல்.

Parliament Series No 487

Name of the institution – Department of Government Factory

Submission of observation of Hon.Minister and steps taken with regard to the reports tabled by the committee on Public Accounts in terms of Standing Order No.119(4).

පාර්ලිමේන්තු මාලාව අංක 487
ආයතනයේ නම රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව

	කමිටුව විසින් ලබා දෙන නිර්දේශ	නිර්දේශ ක්‍රියාත්මක කිරීමට ආයතනය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග/ වත්මන් තත්ත්වය
01.	මූදල් රෙගුලාසි (මු.රෙ.) 513 ප්‍රකාරව 2022 දෙසැම්බර් 31 දිනට රජයේ කර්මාන්තශාලාවේ කළ වැඩ අත්තිකාරම් ගිණුමෙහි (31003) අධිකාරය නොලත් මෙහෙයුම් අලාභය රු.70,758,133 ක් විය. මේ සම්බන්ධයෙන් 2022 නොවැම්බර් 30 දිනට පිළියෙල කරනු ලැබූ ලාභඅලාභ ගිණුම ප්‍රකාරව 2022 දෙසැම්බර් 31 දිනට ඇස්තමේන්තුගත අලාභයට එරෙහිව රු.මිලියන 150 ක ප්‍රතිපාදන සලසා දෙන ලෙස කර්මාන්තශාලා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් 2022 දෙසැම්බර් 16 දිනැති සහ 2C/සීමා සංශෝධන/365/ 02(2022-2025) දරන ලිපිය මඟින් ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගෙන් ඉල්ලා තිබුණි. කෙසේ වෙතත්, 2023 මැයි 19 වන දින දක්වා අදාළ මෙහෙයුම් පාඩු පියවා ගැනීම සඳහා එම ප්‍රතිපාදනය සැලසී නොතිබුණු බව කමිටුව නිරීක්ෂණය කළේය. තවද, රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව 2022 වර්ෂයේ කළ වැඩ අත්තිකාරම් ගිණුමේ මූල්‍ය කාර්යය සාධනය රු.70,758,133 ක මෙහෙයුම් පාඩුවක් ලෙස සටහන් වුව ද විගණනයට පළමුව ඉදිරිපත් කළ ගිණුම්වල මෙහෙයුම් පාඩුව රු.මිලියන 44 ක් ලෙද සටහන් වී ඇති බව ද, පසුව විගණන නිරීක්ෂණ මත ගිණුම්වලින් ඉවත් කර තිබූ වත්කම් නැවත ගැලපීමක් කර සංශෝධිත ගිණුම් වල මෙහෙයුම් පාඩුව රු.මිලියන 70 ක් ලෙස සටහන් කර ඇති බව ද කමිටුව හමුවේ අනාවරණය විය. කොවිඩ් සමයේ සේවකයින් සේවයට වාර්තා කළ ද නිෂ්පාදනය අඩු වූ බවත් වැටුප් අඛණ්ඩව ගෙවීමට සිදු වූ බවත් ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා ප්‍රකාශ කළේය. රජයේ කර්මාන්තශාලාවේ සාමාන්‍ය පරිපාලනය සඳහා ලබා ගත් වත්කම් හා නිෂ්පාදන සඳහා ලබා ගත් වත්කම් වෙන් කර ගලපා සකස් කරන ලද ගිණුම් මගින් රු.මිලියන 44 අලාභයක් ලෙස පළමුව සටහන් කරන ලද බව ද, පසුව විගණකාධිපති නිරීක්ෂණ මත අදාල ගැලපීම් කිරීමෙන් පසු රු.මිලියන 70 ක අලාභයක් සටහන් කරන ලද බව ද ප්‍ර.ග.නි/ග.නි. ප්‍රකාශ කළේය. එබැවින්, 2023 වර්ෂය සඳහා කළ වැඩ අත්තිකාරම් ගිණුමට ගැලපිය යුතු වත්කම් හඳුනා ගැනීමට කමිටුවක් පත් කර ඇති බව ද හෙතෙම වැඩිදුරටත් ප්‍රකාශ කළේය. තව ද කොවිඩ් හා ඉන්ධන අර්බුදය ද දෙපාර්තමේන්තුවේ මූල්‍යමය පාඩු තත්වය සඳහා හේතු වූ බව මෙහිදී ප්‍රකාශ විය.	2022 දෙසැම්බර් 31 දිනට කළවැඩ අත්තිකාරම් ගිණුමේ (31000) පැවති රු.70,758,133/- ක අධිකාරය නොලත් මෙහෙයුම් අලාභය පියවා ගැනීම සඳහා, 2023 දෙසැම්බර් 18 දිනැතිව 310-2-1-1701 වැය ශීර්ෂයෙන් රු.70,800,000/- ක ප්‍රතිපාදන මාරු කිරීම වෙනුවෙන් මු.රෙ.66 අනුමැතිය ලබාගෙන ඇති අතර, 2023 දෙසැම්බර් 31 දිනට රු.70,758,133.57 ක අලාභය 310-2-1-1701 වැය විෂයය මගින් කපා හැර ඇත.

	රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුවේ 2022 වර්ෂය සඳහා වූ කළ වැඩ අත්තිකාරම් ගිණුමේ සටහන් වී ඇති රු.70,758,133 ක අධිකාරය නොලත් මෙහෙයුම් අලාභය සම්බන්ධයෙන් අදාල දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කරන ලද සාධක/ කරුණු සලකා බැලීමෙන් අනතුරුව, සිදු වී ඇති මෙහෙයුම් අලාභය සඳහා එම සාධක/කරුණු හේතු විය හැකි බව කමිටුව නිරීක්ෂණය කළේය.	
02.	රජයේ තක්සේරු දෙපාතමේන්තුව මගින් නිකුත් කරන ලද ගොඩනැගිලි තක්සේරු වටිනාකම රු.327,400,000 ක් වූ අතර (ACA-6) ආකෘතියෙහි එහි අගය රු.387,000,000 ක් වූ හෙයින් රු.60,000,000 ක පමණ විචලතාවයක් පවතින බව කමිටුව නිරීක්ෂණ කළේය. කර්මාන්තශාලාව පිහිටා ඇති ඉඩමේ ගොඩනැගිලි වටිනාකම රු.327,400,000 ක් වූ බවත්, කර්මාන්තශාලා සේවක නිවාසවල වටිනාකම රු.60,000,000 ක් වූ බවත් 2015 වසරේදී රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කරන ලද තක්සේරු වාර්තාවේ සඳහන් වූ බව ගණන් දීමේ නිලධාරියා ප්‍රකාශ කළේය. කොළොන්නාව ආයතන පරිශ්‍රයේ පිහිටි ඉඩම සහ ගොඩනැගිලි නිල නිවාස ලෙස වැරදි ලෙස සඳහන් කර ඇති බවත්, පසුව තක්සේරු දෙපාර්තමේන්තුවේ අංක SAV/MCES/2012/01 සහ 2021.04.22 දිනැති ලිපිය මගින් කොළොන්නාව රජයේ කර්මාන්තශාලාව රු.327,400,000 ලෙස නිවැරදි කර ඇති බවත් වාර්තාවේ සඳහන් විය.	2015.02.23 දිනැතිව රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කර ඇති වාර්තාව අනුව CV/SA/DGF/CD/01 යොමු අංකය යටතේ රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව පිහිටි ඉඩමේ ගොඩනැගිලිවල වටිනාකම රු. 327,400,000/- ක් බවත් CV/SA/DGF/CD/02 යොමු අංකය යටතේ අනෙකුත් සේවක නිල නිවාසවල වටිනාකම රු. 60,000,000/-ක් බවත් සඳහන් කර ඇත. තවද, 2021.04.22 දිනැති රජයේ තක්සේරු දෙපාර්තමේන්තුවේ SAV/MCES/2012/01 (CV/SA/DGF/CD/01) අංක දරණ ලිපිය මගින් රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව පිහිටි අක්කර 15 ඉඩමේ ගොඩනැගිලි වටිනාකම රු.327,400,000/- ලෙස වාර්තා කර ඇත. ඒ අනුව ඉහත සඳහන් කර ඇති රු.327,400,000/- හා රු.60,000,000/- යන දෙකෙහි එකතුවක් ලෙස සියලු ගොඩනැගිලි වල වටිනාකම දක්වා ඇත.
03.	2021 වර්ෂයේ දී කළ වැඩ අත්තිකාරම් ගිණුමට අදාලව රු.53,161,909 ක් වටිනා ණය ගැනියන් කපා හැරීමට කිසිඳු අනුමැතියක් විගණනයට ඉදිරිපත් කර නොමැති බව කමිටුව නිරීක්ෂණය කළේය. 2009 වර්ෂයේදී වාර්තා නොකළ රු.මිලියන 53 ක පමණ ණය ශේෂය සම්බන්ධයෙන් කමිටුවක් පත් කළ බවත්, මෙම ණය මුදල අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතිය සඳහා යොමු කිරීමෙන් පසු කපා හැර ඇති බවත් අමාත්‍යවරයා ප්‍රකාශ කළේය.	ණය ශේෂ කපා හැරීම සඳහා රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව වෙත අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත. මෙතෙක් අනුමැතිය ලැබී නොමැත.

04.	තැපැල් දෙපාර්තමේන්තුවේ ප්‍රවාහන අංශය සඳහා තාවකාලික ගොඩනැගිල්ලක් ඉදි කිරීම වෙනුවෙන් ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව විසින් ඉදිරිපත් කරන ලද රු.104,412,899 ක් වූ ඇස්තමේන්තුවට තැපැල් දෙපාර්තමේන්තුව එකඟ වී 2018 දෙසැම්බර් 31 දිනට රු.3,795,000 ක් ගෙවා තිබුණි. කෙසේ වෙතත්, ඉදිකිරීම් සඳහා යෝජිත ඉඩමේ පස සුදුසු නොවන බව 2019 ජනවාරි 13 දින පවත්වන ලද සාකච්ඡාවේදී තහවුරු වූ බැවින්, වෙනත් ස්ථානයක ඉදිකිරීම් කටයුතු සඳහා නව සැලැස්මක් සකස් කරන ලද අතර, 2019 මාර්තු 14 දින තැපැල් දෙපාර්තමේන්තුවෙන් රු.10,710,572 ක් සහ 2020.03.06 දින රු.7,694,000 ක් වශයෙන්, මුළු එකතුව රු.22,199,572 ක් අයකර ගෙන තිබුණි. කෙසේ වෙතත්, 2022 දෙසැම්බර් 31 වන විට ව්‍යාපෘතියේ ප්‍රගතිය 10% ක් පමණක් බවත්, ව්‍යාපෘතිය සම්පූර්ණ කිරීමට හෝ ලැබුණු මුදල් ආපසු ගෙවීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොමැති බවත් කමිටුවේ අවධානයට ලක් විය. ඉදි කිරීම සිදු කිරීමට යෝජිත ඉඩම පිළිබඳ ගැටලුවක් මතු වී ඇති බැවින් නාගරික සංවර්ධන අධිකාරිය විසින් මේ වන තෙක් මෙම ව්‍යාපෘතිය සඳහා අනුමැතිය ලබා දී නොමැති බව ප්‍ර.ග.නි/ග.නි. ප්‍රකාශ කළේය.	මෙම ගොඩනැගිල්ල ඉදි කිරීම සඳහා 2025.01.10 දිනැති ලිපිය මගින් අනුමැතිය ලැබී ඇත. මීට අමතරව, නට් සහ බෝල්ට් (Nut & Bolt) සවි කර තනි මහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීමට සහ මායිම් තාප්පය සංවර්ධනය කිරීමට ද ඉහත ලිපිය මඟින් පවරා තිබුණි. නමුත් ජල සැපයුම ලබා ගැනීමේ ගැටළුවක් මත පසුගිය වසරේ ඉදිකිරීම් කටයුතු කිරීමට නොහැකි විය. මෙම ඉදිකිරීම් කටයුතු මෙම වසරේ සිදු කරන්නේ කෙසේද යන්න පිළිබඳව තැපැල් දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡාවක් 2026.06.05 දින සාකච්ඡාවේ දී එකඟ වූ පරිදි මෙම දෙපාර්තමේන්තුවේ නිලධාරීන් ගොඩනැගිල්ල ඉදිකිරීමට යෝජිත ඉඩම පරීක්ෂාවට ලක් කරන ලදි. එහිදී එහි පවතින අඩුපාඩු එනම්,ජල සැපයුම,විදුලි සැපයුම යථා තත්වයට පත් කර දීමට තැපැල් දෙපාර්තමේන්තුව එකඟ විය.ඉන් අනතුරුව ඉදිකිරීම් කටයුතු කරගෙන යාමට කටයුතු කරනු ලැබේ. නැවත මුදල් ලබා ගැනීම අවශ්‍ය නොවන බවත් මෙම කාර්යය නිම කර ගැනීම ඉතා අත්‍යවශ්‍ය කටයුත්තක් බවත් තැපැල් දෙපාර්තමේන්තුව ප්‍රකාශ කර ඇත. ඒ අනුව ඉදිරියේදී උක්ත මුදල් භාවිතා කරමින් සුදුසු ගොඩනැගිල්ලක් ඉදිකිරීමට කටයුතු කරනු ලැබේ.
05	මධ්‍යම සංස්කෘතික අරමුදල සඳහා රු.32,391,346 වටිනා විදුලි පහන් කණු 191 ක් සැපයීම සඳහා 2019 වර්ෂයේ ආරම්භ කරන ලද ව්‍යාපෘතිය අතරමග නවතා දමා ඇති බවත්, 2022 දෙසැම්බර් 31 දිනට රු.2,707,515 ක් වටිනා විදුලි ලාම්පු කණු 17 ක් පමණක් නිම කර තිබූ බවත්, එබැවින් භෞතික ප්‍රගතිය 9% ක් බවත් කමිටුව නිරීක්ෂණය කළේය. ඉතිරි චීනවට්ටි පහන් කණු කොටස්, වීදුරු ආවරණ සහ ඇලුමිනියම් කොටස් ආදිය වැඩමුළු අංක 01 සහ වැඩමුළු අංක 06 හි නිෂ්ක්‍රීයව පවතී.	පෞරාණික කැටයම් සහිත කණුවක ආදර්ශය අනුව නිමවා ඇති මෙම කණු වෙනත් ආයතන වලට විකිණීමට කටයුතු කර ගෙන යනු ලැබේ.
06	වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ උඟව කුඩාඔය ජලාශය සඳහා දිය දොරටු සවි කිරීම සඳහා වූ රු.12,708,000 වූ ඇස්තමේන්තුගත වටිනාකමකින් යුත් ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය 20% ක් පමණ වීම පිළිබඳ කමිටුව අවධානය යොමු කළේය. මෙම ව්‍යාපෘතියේ පළමු අදියර වන දිය දොරටු සාදා නිම කර භාර දී ඇති බව ප්‍ර.ග.නි/ග.නි. ප්‍රකාශ කළේය.	දැනට එක් ගේට්ටුවක් සම්පූර්ණයෙන් සවි කර අවසන් කර ඇති අතර, එහි පද්ධතිය හොඳින් ක්‍රියා කරයි. අනෙක් පද්ධතියේ හයිඩ්‍රෝලික් සිලින්ඩර්වල පවතින දෝෂ නිසා සාර්ථකව ක්‍රියාත්මක නොවේ. කොන්ත්‍රාත්කරු විසින් අවශ්‍ය අළුත්වැඩියාවන් කරනු ලැබේ. දැනට 70% පමණ ප්‍රගතියක් අත්කරගෙන ඇත. දෙවන දොරටුවේ හයිඩ්‍රොලික් සිලින්ඩර් වල අවශ්‍ය අලුත්වැඩියාවන් සිදු කිරීමෙන් පසු ඉදි කිරීම් සම්පූර්ණ කර මෙම වසරේ දී භාරදෙනු ඇත.

07	දෙපාර්තමේන්තුවට අයත් නිළ නිවාස 37 ක් භාවිතා නොකර ඌන උපයෝජිතව පැවතීම ද එම පරිශ්‍රයේම පිහිටි රූඩ් 01 පර්චස් 08.87 ක බිම් ප්‍රමාණය පිහිටි බැරල් මඩුව ද නිෂ්කාර්යව පැවතීම පිළිබඳව කමිටුව ප්‍රශ්න කළේය. මෙම නිල නිවාස 120 තුළ අලුත්වැඩියා කටයුතු සිදු කරන බවත් නාන කාමරවල ජල කාන්දුවක් ඇති බවත් සඳහන් විය. මෙම නිල නිවාස පදිංචියට යෝග්‍ය නොවන තත්වයක පවතින බවත්, අලුත්වැඩියා කටයුතු සිදුකිරීමේ කාර්යය නාගරික සංවර්ධන අධිකාරියට පවරා ඇති බවත්, අලුත්වැඩියා කටයුතු සිදුකෙරෙමින් පවතින බවත් ප්‍ර.ග.නි/ග.නි. ප්‍රකාශ කළේය.	රූඩ් 01 පර්චස් 8.87 ක ප්‍රමාණයකින් යුත් බැරල් මඩුව ඉදිකර ඇති ඉඩම, නිල නිවාස පිහිටි පරිශ්‍රයේ පිහිටා නොමැති අතර, එය මීතොටමුල්ල මාර්ගය අසල පිහිටා ඇති දුම්රිය දෙපාර්තමේන්තුවට අයත් රක්ෂිත ඉඩමකි. දෙපාර්තමේන්තුව මෙම ඉඩම බදු පදනම මත භාවිතා කරමින් සිටි අතර, එය දැනට භාවිතයේ නොමැති බැවින්, ඉඩම ආපසු ලබා ගන්නා ලෙස දුම්රිය දෙපාර්තමේන්තුවට කිහිප වතාවක්ම දැනුම් දී ඇත. නිල නිවාස 37 න් නිවාස 24 ක් දැනටමත් වාසයට නුසුදුසු තරමට ජලය කාන්දු වෙමින් පවතී. මේ පිළිබඳව නාගරික සංවර්ධන අධිකාරියට දන්වා ඇත. අනාගතයේදී අලුත්වැඩියා කටයුතු ආරම්භ කරන බව දැනුම් දී අතර, ඉන් පසුව සියලුම නිවාස පොරොත්තු ලේඛනයට අනුව අදාළ සේවකයින්ට ලබා දීමට කටයුතු කරනු ලැබේ.
08	රජයේ කර්මාන්තශාලාව පිහිටි ඉඩම ද ඇතුළුව දෙපාර්තමේන්තුව සතු අක්කර 24 රූඩ් 01 පර්චස් 1.87 ක් වූ ඉඩම් 3 ක් වෙනුවෙන් දෙපාර්තමේන්තුව සතුව ඔප්පු නොමැති බව ද මිනින්දෝරු සැලැස්ම පදනම් කර ගෙන ප්‍රාදේශිය ලේකම් මගින් අයිතිය තහවුරු කර ගැනීමට කටයුතු කර නොතිබීම ද කමිටුවේ අවධානයට ලක් විය. නාගරික සංවර්ධන අධිකාරිය වෙත නැවත පැවරීම සඳහා කටයුතු කෙරෙන අක්කර 09 ක ඉඩම් කොටස හැර මෙම ඉඩමේ ඉතිරි අක්කර 15 හි මැනුම් කටයුතු සිදුකර ඇති අතර ඊට අදාල ඔප්පුව ප්‍රාදේශිය ලේකම් හරහා ලැබිය යුතු බව ද ප්‍ර.ග.නි. ප්‍රකාශ කළේය.	මෙම ඉඩම් ප්‍රාදේශිය ලේකම් සතු ඉඩම් වන අතර, ඒවායේ භුක්තිය රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව සතු වේ. කෙසේ වෙතත් දැනට රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව විසින් භුක්ති විඳින ඉඩම් කොටස් පවරා දෙන ලෙස ඉල්ලීමක් කර ඇත.
09.	රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව 2023 වසර සඳහා රු.මිලියන 226 ක පමණ වැඩ සිදු කර ඇති බව ද ඉන් දළ වශයෙන් 50% ක් පමණ දෙපාර්තමේන්තුවේ සිටින ඒකාබද්ධ සේවයේ හා දෙපාර්තමේන්තුගත සේවක වේතන සඳහා වැය වන බව ද ඒ අනුව රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුවේ ඵලදායීතාවය සතුටුදායක මට්ටමක නොපවතින බව ද තත්‍ය කාර්ය මණ්ඩලය, අනුමත කාර්ය මණ්ඩලයෙන් 50% ක් පමණ බව ද කමිටුව නිරීක්ෂණය කළේය. වර්තමානයේ දී මහා භාණ්ඩාගාරයේ උපදෙස් පරිදි මෙම දෙපාර්තමේන්තුව ප්‍රතිව්‍යුහගතකරණයට සැලසුම් සකස් කරමින් පවතින බව ප්‍ර.ග.නි/ග.නි. ප්‍රකාශ කළේය.	2023 වසරේදී කොවිඩ් වසංගතය අවසන් වීමත් සමඟ රජයේ කර්මාන්තශාලාවට ලැබුණු වැඩ ප්‍රමාණය අවම මට්ටමක පැවතුණි. කෙසේ වෙතත්, රජයේ කර්මාන්තශාලාව උපයන මුදලින් වැටුප් සහ දීමනා ලබන දෙපාර්තමේන්තු සේවකයින්ගේ වැටුප් හා දීමනා කිසිදු හිඟයකින් තොරව ගෙවීමට හැකි විය. එත්මන් ලේකම්වරයාගේ සහ ගරු අමාත්‍යවරයාගේ උපදෙස් පරිදි දෙපාර්තමේන්තුව ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා වූ සැලැස්මක් මේ වන විට සකස් කරමින් පවතී.

වෛද්‍ය සුසිල් රණසිංහ
අමාත්‍ය
නිවාස ඉදිකිරීම් හා ජල සම්පාදන අමාත්‍යාංශය